047

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2008

**ESP 2255** - අධ්‍යාපනයේ සමකාලීන මතවාද

කාලය - පැය තුනයි.

---

දිනය - 2008.05.31 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න තුනකට <u>(03) පමණක්</u> පිළිතුරු සපයන්න.

01. (i) පහත දැක්වෙන තීරණ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රජාතන්ත්‍රීකරණය සුරැකීම සඳහා දායක වී ඇති ආකාරය විවේචනාත්මකව විභාග කරන්න.

i. සැමට අධ්‍යාපනය නොමිලේ ලබාදිය යුතුය.
ii. අධ්‍යාපනය ලබාදීමේ වගකීම රජය සතුවිය යුතුය
iii. අධ්‍යාපනය මව්බසින් සැපයිය යුතුය.

(ලකුණු 33)

02. "අධ්‍යාපන ක්‍රමයෙහි ඇති විෂමතාව නිසා සමාජ අවාසිදායක තත්වයන් තවත් තීව්‍ර වන බව අවධාරණය කිරීම වැදගත් වේ. එබඳු අසාධාරණකම් මුලිනුපුටා දැමීමට ගුරුවරුන්ට හැකියාවක් නොමැති වුවත් මෙම අසාධාරණකම් අඩු කිරීමට ඔවුන්හට කටයුතු කළ හැක. අධ්‍යාපනයේ සාධාරණත්වය සාධනයට අඛණ්ඩව බාධා කරන ගැටලු /මතවාද පිළිබඳ සංවේදනාක බව (දැනුවත් බව) ප්‍රජාතාන්ත්‍රීකරණයටත්, මායිම්කරණය අඩු කිරීමටත් , ස්ත්‍රී පුරුෂ සමානත්වයටත් උපකාරීවනවා සේම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට බොහෝදුරට දායක වනු ඇත."

ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින්,

(i) විශේෂයෙන් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක වන සාධාරණත්වය පිළිබඳ ගැටලුව/මතවාදයෙහි බහුමුහුණත් ස්වභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii) අධ්‍යාපනය සැමට සහතික කිරීමට අවශ්‍ය වන අයිතියක් වන්නේ ඇයිදැ'යි පැහැදිලි කොට විශේෂයෙන් ශ්‍රී ලංකාව ඇසුරින් මෙම අයිතිය සහතික කිරීමට අඛණ්ඩව බාධා කරන කරුණු හඳුනා ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 13)

(iii) අධ්‍යාපනයේ සාධාරණත්වය සාධනය සහතික කිරීමට ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමේ දී ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

(ලකුණු 10)

03. (i) "ගුණාත්මකභාවය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක භාවය සහතික කිරීම ගැටලුවක් ලෙස ඔබ සංජානනය කරන්නේ කෙසේදැ'යි නිදසුන් දක්වමින් පරීක්ෂා කරන්න. (ලකුණු 13)

(iii) මෙම ගැටලුව අවම කිරීමට ගුරු අධ්‍යාපනඥයෙක් ලෙස ඔබට දායක විය හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 15)

04. (i) "බහුවිධ සමාජ" හා "බහු සංස්කෘතික අධ්‍යාපනය" යන පද නිර්වචනය කරන්න. (ලකුණු 08)

(ii) ජාතික සමෝධානය ප්‍රවර්ධනය සඳහා බහුවිධ සමාජ තුළ බහු-සංස්කෘතික අධ්‍යාපනය හඳුන්වාදීමේ ඇති වැදගත්කම විභාග කරන්න. (ලකුණු 12)

(iii) බහුවිධ සමාජයක ජාතික සමෝධානය ප්‍රවර්ධනය කිරීමෙහි ලා පන්තිකාමර මට්ටමේදී ගුරුවරුන්ට භාවිත කළ හැකි උපදේශන උපාය මාර්ග නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 13)

05. (i) ඔබට "ගෝලීයකරණය" නිර්වචනය කළ හැක්කේ කෙසේද ? (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවෙහි දිස්වන ගෝලීයකරණයේ වැදගත් ප්‍රතිඵල පහක් නම් කරන්න. (ලකුණු 10)

(iii) ගෝලීයකරණය ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ වෙනස්කම්වලට මුල්වී ඇත්තේ කෙසේදැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iv) සමාන අධ්‍යාපන අවස්ථා ඉලක්කය කැප නොකොට ගෝලීයකරණයේ ප්‍රතිඵල කළමනාකරණය කිරීමට ශ්‍රී ලාංකික අධ්‍යාපනයට ගත හැකි ක්‍රමෝපායයන් තුනක් යෝජනා කොට විස්තර කරන්න. (ලකුණු 08 1/2)

06. "....... හෙට උදාවන ලොව අද අප දන්නා ලොවට වඩා මූලික වශයෙන් වෙනස් විය යුතුය. අප නව සහස්‍රයට පිය නගන විට 'තිරසර අනාගතයක්' ගොඩනැගීමට වෙර දැරිය යුතුය..... අපේ ස්වභාවික පරිසරය සමඟ එකඟතාවක් ගොඩනැගීම අනාගත ලෝකයේ උපදේශක පාඨය විය යුතුය."

(ෆෙඩ්රිකෝ මේයර්,අධ්‍යක්ෂ ජනරාල් යුනෙස්කෝ 1999)

(i) ස්වභාවික පරිසරයට අදාල 'තිරසර අනාගතයක්' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 08)

(ii) වත්මන් ලොව මුහුණ දෙන ප්‍රධාන පාරිසරික ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) ස්වභාවික පරිසරය සමඟ එකඟතාවක් සංවර්ධනය කර ගැනීම සඳහා අධ්‍යාපනික ප්‍රතිපත්ති හා වැඩ සටහන් ප්‍රති සැලසුම් කිරීමේදී අධ්‍යාපනය සතු භූමිකාව අවශ්‍යතන්හිදී නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

- හිමිකම් ඇවිරිණි. -